ලංකාදීප

# ගල්අඟුරු බලාගාරය වෙනුවට ඩීසල් බලාගාර දෙකක් තැදීමෙන් කෝටි 20,000ක පාඩුවක්

## ලංවිම ඉංජිනේරු සංගමය කියයි

(රංජන් කස්තුරි)

**2018 වසරේ ඇතිවිය හැකි විදුලිය අර්බුදයේ වගකීම ලංකා විදුලි බල මණ්ඩලය පිට පටවා අධික මිල ගණන් යටතේ පෞද්ගලික අංශයෙන් විදුලිය මිලදී ගැනීමේ කුමන්ත්‍රණයක් දියත් වන බවට ලංකා විදුලිබල මණ්ඩලයේ ඉංජිනේරු සංගමය චෝදනා කරයි.**

ඒ අනුව මෙගාවොට් 300ක ඩීසල් බලාගාරයක් කෙරවලපිටියේද තවත් මෙගාවොට් 170ක බලාගාරයක් හම්බන්තොටද ඉදිකිරීමට පෞද්ගලික අංශයට පැවරීමට නියමිතව ඇතැයි ලංවිම ඉංජිනේරු සංගමයේ සභාපති අතුල වන්නිආරච්චි මහතා කීය.

ගල්අඟුරු බලාගාරයක් වෙනුවට ඩීසල් බලාගාර දෙකක් ඉදිකිරීම නිසා වසර හතරක කාලයක් තුළ රටට සිදුවන පාඩුව රුපියල් කෝටි 20,000ක් වන අතර එය කටුනායක අධිවේගී මාර්ගයට වැයකළ වියදම මෙන් පස් ගුණයක් වන බවද ඔහු පැවසීය.

විදුලිය බලාගාර ඉදිකිරීමේ සැලැස්ම අවුල්කරගෙන ඇති අමාත්‍යාංශ රට විදුලිය අර්බුදයකට තල්ලුකරගෙන යන බවද එහි වගකීම විදුලිය ඉංජිනේරුවන් පිට පැටවීමට උත්සාහ දරන බවද වන්නිආරච්චි මහතා කීය.

කෙරවලපිටිය සහ හම්බන්තොට ඩීසල් බලාගාර ඉක්මනින් ඉදිකිරීමේ සැලැස්මක් නැති බවට චෝදනා කරමින් විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා ලංවිම සභාපතිවරයාට යවා ඇති ලිපියෙන් එම උත්සාහය පැහැදිලි වන බවද වන්නිආරච්චි මහතා පැවසීය.

යෝජිත ඩීසල් බලාගාර දෙක ලංවිම මගින් ඉදිකළ යුතු යැයි ඉංජිනේරු සංගමය පෙන්වා දුන්නත් රජය සතුව මුදල් නොමැති නිසා ඒවා ඉදිකිරීම පෞද්ගලික අංශයට දීමට රජය තීන්දු කර ඇතැයි ද අතුල වන්නිආරච්චි මහතා කීය.

යෝජිත බලාගාර මිලදී ගැනීමේ කටයුතු පමා කරන බවට දෝෂාරෝපණය කරමින් විදුලිබල අමාත්‍යාංශයේ ලේකම්වරයා ලංවිම සභාපතිවරයාට ලිපියක් යවා ඇතත් සත්‍යවශයෙන්ම එම පමාකිරීම ලේකම්වරයා විසින් සිදු කළ බවද ඔහු පැවසීය.

රජයේ මිලදී ගැනීමේ පටිපාටියට අනුව පුද්ගලික බලාගාරවලින් විදුලිය මිලදී ගැනීමේ පිළිගත් ක්‍රමවේදයක් නොමැති බවද 2006 වසරේ සිට මිලදී ගැනීමේ පටිපාටිය වෙනස්කර ඇති නිසා ටෙන්ඩර් කැඳවීම නීති විරෝධී බවද වන්නිආරච්චි මහතා සඳහන් කළේය.

ටෙන්ඩර් කැඳවීමකින් කෙරවලපිටියේ සහ හම්බන්තොට මිල වැඩි බලාගාර ඉදිකිරීමට තම ව්‍යාපාරික හිතවතුන්ට අවස්ථාවක් ලබාදීමට ඇතැම් දේශපාලනඥයන් දරන උත්සාහයට අමාත්‍යාංශය උපකාර කරන බවටද ඔහු චෝදනා කළේය.

ව්‍යාපාරිකයින්ගේ මඩිය සරුකිරීමට වක්‍රාකාරයෙන් උදව් කිරීම වෙනුවට ලේකම්වරයා කළ යුත්තේ තරගකාරී මිල කැඳවීම්වලට ඇති සුළු නීතිමය බාධා කැබිනට් අනුමැතියකින් හෝ ඉවත්කර ගැනීම බවද අතුල වන්නිආරච්චි මහතා කීය.